# ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය - 2012

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය ව්‍යාවනය

මෙම වාර්තාවේ 1.2.3 ඡේදයේ දක්වා ඇති වැදගත් කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) මණ්ඩලය විසින් ලබා ගෙන තිබූ බැංකු ණය සඳහා මණ්ඩලය සතු කොළඹ කොටුව යෝර්ක් වීදියේ පිහිටි ඉඩම් සහ ගොඩනැගිල්ල ඇපයට තබා තිබුණද, එය මූල්‍ය ප්‍රකාශනවලින් අනාවරණය කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දරන ලද රු.1,754,623 ක් වූ වියදම් ගිණුම්වලින් අත්හැරීම හේතුවෙන් වර්ෂයේ ලාභය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) අමාත්‍යාංශයක ක්‍රියාත්මක වැඩසටහනක් යටතේ කෞතුකාගාරයේ ලක්සල ප්‍රදර්ශනාගාරයක් ඉදිකිරීම වෙනුවෙන් ලද රු.100,000,000 ක මුදලින් රු.10,000,000 ක් පුනරාවර්තන ප්‍රදානයක් ලෙස සමාලෝචිත වර්ෂයේ ආදායමට බැර කර තිබුණි. එහෙයින් සමාලෝචිත වර්ෂයේ ලාභය රු. 10,000,000 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) අලෙවිකළ නොහැකි (Damages) සහ අළුත්වැඩියා භාණ්ඩ (පිරිවැයට) පිළිවෙලින් රු.5,810,391 ක් හා රු.1,065,729 ක් වශයෙන් එකතුව රු.6,876,120 ක් අවසන් තොග යටතේ දක්වනු වෙනුවට පිළිවෙලින් සදොස් ලෙස ණයගැතියන්, තැන්පතු හා කලින් ගෙවීම් යටතේ දක්වා තිබුණි.

(ඉ) යහසාධක අරමුදලින් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණු රු.1,000,000 ක් ආයෝජන ලෙස නොදක්වා මුදල් හා මුදල් වලට සමාන දෑ ලෙස දක්වා තිබුණි.

(ඊ) භාවිතයේ පවතින කටුබැද්ද, වරාගොඩ හා කෙසෙල්වත්ත ව්‍යාපෘතිවලට අයත් එකතුව රු.63,031,672 ක් වූ දේපල, පිරියත හා උපකරණ සමාලෝචිත වර්ෂය සඳහා ක්ෂය කර නොතිබුණි.

1.2.2 **නිරවුල් නොකළ ශේෂ**

**රු.15,437,106** ක් වූ ණයගැති හා තැන්පතු ශේෂවලින් රු.11,971,468 ක් වර්ෂ 03 කට වඩා පැරණි ශේෂ වූ අතර එම ශේෂ නිරවුල් කිරීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි.

1.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු පහත සඳහන් විෂයයන් සඳහා ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා ඒවා සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ සත්‍යාපනය කිරීමට නොහැකි විය.

| විෂයය | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| ස්ථාවර වත්කම් | 171,754,361 | (i) ස්ථාවර වත්කම් ලේඛණ<br>(ii) සමීක්ෂණ මණ්ඩල වාර්තා |
| කෙරීගෙන යන වැඩ | 123,112,952 | (i) ගෙවිය යුතු ආරක්ෂණ තැන්පතු<br>(ii) වියදම් විස්තර |
| ජංගම වත්කම් | 352,336,944 | (i) වත්කම් ලේඛණ<br>(ii) සමීක්ෂණ මණ්ඩල වාර්තා<br>(iii) කාල විශ්ලේෂණය |
| වියදම් | 11,947,638 | (i) වියදම් විස්තර<br>(ii) මුදල් ලබාගත් තහවුරු කිරීම් |
| | 659,151,895 | |

### 1.2.4 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

විගණනයේදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති,රීති හා රෙගුලාසි යනාදියට යොමුව | වටිනාකම | අනුකූල නොවීම පිළිබඳ විස්තරය |
|---|---|---|
| | රු. | |
| (අ) 1982 අංක 35 දරන ජාතික ශිල්ප සහා අනුබද්ධිත පනතේ 44 (ආ) වගන්තිය | - | ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලයේ ප්‍රධාන පරමාර්ථය දේශීයව හා විදේශීයව හස්ත කර්මාන්ත භාණ්ඩ විකිණීම හා අලෙවි ප්‍රවර්ධන කිරීම වුවත් සමාලෝචිත වර්ෂයේ දී විදේශ රටවලට කිසිදු භාණ්ඩයක් අපනයනය කර නොතිබුණි. |
| (ආ) <u>මුදල් රෙගුලාසි</u> | | |
| (i) මු.රෙ. 177 | 8,529,795 | මණ්ඩලයේ ප්‍රදර්ශනාගාර දෙකක රු.8,529,795 ක මුදලක් බැංකුගත නොකර මණ්ඩලයේ විවිධ වියදම් සඳහා සෘජුව වැය කර තිබුණි. |
| (ii) මු .රෙ. 260 සහ මු .රෙ. 385 | 104,602,088 | 2012 වර්ෂයේ ඉදිකිරීම් සඳහා ගෙවීම් කිරීමේදී විවිධ අවස්ථාවල එකතුව රු.104,602,088 ක් අදාල පුද්ගලයින්ට සෘජුව මුදලින් ගෙවා තිබුණි. එකී ගෙවීම් කිරීමේදි ජාතික හැඳුනුම් පත් අංකය ගෙවීම් වවුචරවල සටහන් කර නොතිබුණි. |
| (ඇ) <u>භාණ්ඩාගාර චක්‍රලේඛ</u> | | |
| (i) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | 716,843,145 | පිරිවැය රු. 716,843,145 ක් වූ ස්ථාවර වත්කම්වලට අදාල ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි . |
| (ii) 2002 නොවැම්බර් 28 දිනැති | 11,575,484 | වටිනාකම රු.11,575,484 ක් වූ පරිගණක දෘඩාංග |

| | | |
|---|---|---|
| අංක අයි ඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | | සහ මෘදුකාංග සඳහා වත්කම් ලේඛණයක් පවත්වා නොතිබුණි. |
| (iii) 2011 දෙසැම්බර් 22 දිනැති අංක 47 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 02 ඡේදය | 350,000 | 2011 වර්ෂය වෙනුවෙන් 2012 වර්ෂයේදි මණ්ඩලයේ සේවකයන් 140 දෙනෙකුට රු.10,000 බැගින් ප්‍රසාද දීමනා ගෙවා තිබුණි. ඒ අනුව අදාල චක්‍රලේඛයට පටහැනිව සේවකයන් අතර වැඩිපුර ගෙවා තිබු මුදල රු.350,000 ක් ගෙවා තිබුණි. |
| (iv) 2000 ජනවාරි 11 දිනැති අංක පීඑෆ්/පීඊ/05 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | 32,170,182 | විධිමත් වූ අනුමැතියකින් තොරව මණ්ඩලය විසින් රු.32,170,182 ක් දිරි දීමනා ගෙවා තිබුණි. |
| | 800,000 | ඉහත දිරි දීමනාවට අමතරව චක්‍රලේඛයට පටහැනිව සමාලෝචිත වර්ෂයේ මාණ්ඩලික නිලධාරීන් 31 දෙනාගෙන් 16 දෙනෙකුට සහ උපදේශකයන් 05 දෙනෙකුට රු.50,000 ක් හා රු.25,000 ක් බැගින් රු.800,000 ක් දිරි දීමනා ගෙවා තිබුණි. |
| (v) 2011 සැප්තැම්බර් 15 දිනැති අංක පීඊඩී 58 (2) දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය 02 ඡේදය | 793,000 | (අ) සමාලොචිත වර්ෂයේදී අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ට එක් රැස්වීමක් සඳහා රු.6,000 ක් බැගින් අධ්‍යක්ෂක මණ්ඩල දීමනා ගෙවීම වෙනුවට රු.16,000 ක් බැගින් රැස්වීම් වාර 09 ක් සඳහා එකතුව රු.1,105,000 ක් ගෙවා තිබුණි.චක්‍රලේඛයට පටහැනිව රු.793,000 ක් වැඩිපුර ගෙවා තිබුණි. |
| | 96,000 | (ආ)අධ්‍යක්ෂ මණ්ඩලයට භාණ්ඩාගාරය වෙනුවෙන් පත්කල අධ්‍යක්ෂ මණ්ඩල |

නිළධාරිනිය 2012 නොවැම්බර් 30 දින සිට 2013 ජූලි 01 දින දක්වා ප්‍රසූත නිවාඩු ලබා සිටියදීත් අධ්‍යක්ෂ මණ්ඩල හා විගණන කමිටු රැස්වීම්වලට සහභාගී වී දීමනා ලෙස රු.96,000ක් ලබා ගෙන තිබුණි. කෙසේ වෙතත්, ප්‍රසූත නිවාඩු මත රාජකාරි කටයුතුවලින් බැහැරව සිටියදී වෙනත් රාජකාරි කටයුතු ඉටුකළ නොහැකි බවත්, ඒ සඳහා දීමනා ලබා ගැනීම විධිමත් නොවන බවත් රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ 2013 ජූනි 19 දිනැති අංක EST-7/LEAVE /03/3180 (1) දරන ලිපියෙන් තහවුරු කර තිබුණි.

144,000 (ඇ) (i) සභාපති /ප්‍රධාන විධායක නිළධාරියා ලෙස කටයුතු කරමින් මාසික වැටුපක්/දීමනාවක් ලබන අතර තුර, අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලට සහභාගි වීම වෙනුවෙන් දීමනාවක් ලබාගැනීමට හිමිකමක් නැතත් එය නොසලකා රු.16,000 බැගින් රු.144,000 ක දීමනාවක් ලබා ගෙන තිබුණි.

144,000 (ii) අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකාවක් නොවන මණ්ඩලයේ කළමනාකාර අධ්‍යක්ෂවරියට ද අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලට සහභාගීවීම වෙනුවෙන් චක්‍රලේඛයට පටහැනිව දීමනා ලෙස

| | | |
|---|---|---|
| | | රු.16,000 බැගින් රු.144,000 ක් ගෙවා තිබුණි. |
| (vi) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය 8.3.8 ඡේදය | 4,279,050 | අමාත්‍ය මණ්ඩලයේ පූර්ව අනුමැතියක් ලබා නොගෙන මණ්ඩලය විසින් විවිධ ආයතන හා පුද්ගලයන් වෙත එකතුව රු.4,279,050 ක් වූ මුදල් ත්‍යාග හා පරිත්‍යාග ගෙවා තිබුණි |
| 8.3.9 ඡේදය | 181,009 | රේඛීය අමාත්‍යාංශය විසින් ශ්‍රී ලංකා පදනම් ආයතනයට ගෙවිය යුතුව තිබූ රු.181,009 ක් වූ මුදලක් මණ්ඩලය විසින් ගෙවා තිබුණි. |
| (vii) 1998 ජූනි 05 දිනැති අංක පීඊ1/000/6 (දීමනා) වෙලුම. 11 තාවකාලික අංක රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ ලිපිය | 2,310,000 | මණ්ඩලයේ සභාපතිවරයාගේ සංග්‍රහ වියදම් පමණක් ප්‍රතිපූර්ණය කළ හැකි නමුත්, ඊට පටහැනිව සභාපතිවරයා/ප්‍රධාන විධායක නිලධාරියාට මාසිකව සංග්‍රහ දීමනාවක් ලෙස රු.150,000 ක්ද ගෙවා තිබුණි./තවත් නිලධාරීන් 04 දෙනෙකුට රු.20,000 - රු.7,500 බැගින් මාසික සංග්‍රහ දීමනාවක් ගෙවා තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ දී අවිධිමත්ව ගෙවා තිබුණු මුළු සංග්‍රහ දීමනාව රු.2,310,000ක් විය. |
| (viii) 2008 ඔක්තෝබර් 28 දිනැති අංක පීඊඩී 50 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | 1,800,000 | (අ) සංස්ථා හා මණ්ඩලවල සභාපතිවරයකුට නිල වාහනයක් සමඟ මසකට පෙට්‍රල් ලීටර් 220 ක් හෝ මණ්ඩලයට අයත් වාහනයක් |

පාවිච්චි නොකරන්නේ නම් ඉන්ධන වලට සමාන මාසික දීමනාවක් සමඟ ස්වකීය වාහනයට රු.30,000 ක දීමනාවක් හිමි වුවත්, ඊට පටහැනිව සභාපතිවරයා/ ප්‍රධාන විධායක නිලධාරියා ලෙස සමාලෝචිත වර්ෂයේ දී මසකට රු.150,000 බැගින් රු.1,800,000 ක් වූ මුදලක් ප්‍රවාහන දීමනා ලෙස ලබාගෙන තිබුණි.

3,382,650 (ආ) තවද උක්ත චක්‍රලේඛයට පටහැනිව නිලධාරීන් 30 දෙනෙකුට ප්‍රවාහන දීමනා ලෙස මාසිකව රු.7,500 සිට රු.20,000 ක් දක්වා වූ පරාසයක දීමනාවක් සමාලෝචිත වර්ෂයේ දී ගෙවා තිබුණි. එසේ ගෙවීම් කරන ලද දීමනාවල එකතුව රු.3,382,650 ක් විය.

(ඇ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය

(i) 2.7.5 මාර්ගෝපදේශය

මණ්ඩලය සඳහා අමාත්‍යාංශ ලේකම්වරයා විසින් ප්‍රසම්පාදන කමිටුවක් පත්කර නොතිබුණි. ඒ වෙනුවට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නම්කල ප්‍රසම්පාදන කමිටුවක් පත්කර තිබූ අතර එහි සාමාජිකයන් සභාපති, කළමනාකාර අධ්‍යක්ෂ, විධායක අධ්‍යක්ෂ (මුදල්) හා ව්‍යාපෘති අධ්‍යක්ෂ යන මණ්ඩලයේම නිලධාරීන් ගෙන් සමන්විත වී තිබුණි.

(ii) 4.3 මාර්ගෝපදේශය

වටිනාකම රු.141,073,130 ක් වූ ඉදිකිරීම් කොන්ත්‍රාත්වලට අදාල ඇස්තමේන්තු පිළියෙල කර නොතිබුණි.

| | |
|---|---|
| (iii) 5.4.4 මාර්ගෝපදේශය | පිළිගත හැකි සුරක්ෂණයක් ඉදිරිපත් කිරීම මත කොන්ත්‍රාත් මුදලින් සියයට 20 ක උපරිම මුදලක් අත්තිකාරම් මුදල් ලෙස ගෙවිය හැකි වුවත් ,මණ්ඩලය විසින් අත්තිකාරම් ගෙවීමේ සීමාවෙන් බැහැරව නිසි සුරක්ෂණයක් ලබා නොගෙන කොන්ත්‍රාත් කරුවන්ගේ ඉල්ලීම පරිදි සීමාවකින් තොරව අත්තිකාරම් මුදල් ලබා දී තිබුණි. එය කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 82 සිට සියයට 100 දක්වා වී තිබුණි. |
| (iv) 5.4.6 මාර්ගෝපදේශය | කොන්ත්‍රාත්කරුවන්ට ගෙවිය යුතු සෑම ගෙවීමකින්ම නිශ්චිත මුදලක් වගකීම් කාල සීමාවක් අවසන් වන තුරු රඳවා තබාගත යුතු වුවත්, කොන්ත්‍රාත්කරුවන්ට ගෙවන ලද කිසිදු ගෙවීමකින් එවැනි රඳවා ගැනීම් තබාගෙන නොතිබුණි. |
| (v) 5.4.12 මාර්ගෝපදේශය | සමාලෝචිත වර්ෂය තුළ කොන්ත්‍රාත්කරුවකුට ගෙවන ලද රු.141,073,130 ක් සම්බන්ධයෙන් බදු ඉන්වොයිස් ලබා නොගෙන ගෙවීම් කර තිබූ අතර, එකතු කළ අගය මත බදු (VAT) ආවරණය කර ගැනීම සඳහා ඒ පිළිබඳව, ඊළඟ මස 15 දිනට පෙර විගණකාධිපතිවරයාට පිටපතක් සහිතව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත දැනුම් දී නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය
------------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල
--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේදී මණ්ඩලයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.63,189,722 ක ශුද්ධ ලාභයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ රු.49,629,173 ක ශුද්ධ ලාභයක් විය. එ අනුව, ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී මූල්‍ය ප්‍රතිඵලයේ රු.13,560,549 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මේ සඳහා ඉකුත් වර්ෂයට සාපේක්ෂව මණ්ඩලයේ වෙනත් ආදායම්

රු.13,263,743 ක හා රජයේ ප්‍රදාන රු.10,000,000 ක වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි. කෙසේ වෙතත්, මෙම වාර්තාවේ 2.2.1 (ආ)හා(ඇ) ඡේද ප්‍රකාර සමාලෝචිත වර්ෂයට අදාල වූ වියදම් සහ සදොස් ලෙස දක්වා තිබූ ආදායම් ගලපන ලද්දේ නම් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.11,754,623 කින් අඩු විය හැකිව තිබුණි.

## 2.2 වියදම්වල අසාමාන්‍ය වැඩිවීම්

සමාලෝචිත වර්ෂය තුළ ඉකුත් වර්ෂයට සාපේක්ෂව වියදම්වල පහත සඳහන් පරිදි අසාමාන්‍ය වැඩිවීමක් නිරීක්ෂණය විය.

| | 2012 | 2011 | වෙනස | % |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | |
| විදුලිය | 17,596,510 | 7,269,782 | 10,326,728 | 142 |
| දිරිදීමනා හා අතිකාල | 31,725,549 | 11,075,249 | 20,650,300 | 186 |
| සේවක සුභසාධන | 3,632,148 | 993,389 | 2,638,759 | 266 |
| ගමන් වියදම් - දේශීය | 4,959,019 | 624,130 | 1,334,889 | 696 |
| අධ්‍යක්ෂ මණ්ඩල දීමනා | 1,391,206 | 559,858 | 831,348 | 148 |
| ප්‍රචාරක වියදම් | 5,007,782 | 1,939,219 | 3,068,563 | 158 |
| ආරක්ෂක සේවා | 9,087,361 | 3,402,066 | 5,685,295 | 167 |
| මුද්‍රණ හා ලිපි ද්‍රව්‍ය | 6,014,733 | 1,647,980 | 4,366,753 | 265 |
| ඉන්ධන හා ලිහිසි තෙල් | 3,277,375 | 1,644,679 | 1,632,696 | 99 |
| වාහන පොදු කාර්ය | 11,170,449 | 2,572,220 | 8,598,229 | 334 |
| කොමිස් සහ වට්ටම් | 8,513.517 | 2,020,462 | 6,493,055 | 321 |
| අනුග්‍රහ දැක්වීම | 4.567,550 | 753,461 | 3,814,089 | 506 |
| වෙළඳ ප්‍රදර්ශනය | 666,906 | 29,413 | 637,493 | 2167 |
| අලෙවි ප්‍රවර්ධන වියදම් | 2,577,754 | 119,850 | 2,397,904 | 1333 |
| ණය පොළී | 22,134,804 | 3,021,277 | 19,113,527 | 632 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුල විකුණුම් ආදායම සියයට 73 කින් වර්ධනය වුවත්, ඊට සමාන්තරව වියදම සියයට 77.3 කින් වැඩිවී තිබුණි.

( ආ) කෙසේ වුවද, ඉකුත් වර්ෂයට සාපේක්ෂව ගමන් වියදම් , මුද්‍රණ හා ලිපි ද්‍රව්‍ය, වාහන හා පොදු කාර්ය වියදම් ,කොමිස් සහ වට්ටම්, අනුග්‍රහ දැන්වීම් , වෙළඳ ප්‍රදර්ශනය,අළෙවි ප්‍රවර්ධන වියදම් හා ණය පොලීවල අති විශාල වැඩිවීමක් සමාලොචිත වර්ෂයේදී සිදුවී තිබුණි. ඉකුත් වර්ෂය හා සසඳන කල දක්නට ලැබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්ය සාධනය

2012 වර්ෂයේදී තුම්මුල්ල හා අනෙක් ශාඛාවල ඉලක්ක ගත විකුණුම් හා තථ්‍ය විකුණුම් අතර පහත වෙනස්කම් අනාවරණය විය.

| ශාඛා | ඉලක්කගත විකුණුම් | තථ්‍ය විකුණුම් | වෙනස | ප්‍රතිශතය |
|---|---|---|---|---|
| | රු. 000 | රු.000 | රු.000 | % |
| තුම්මුල්ල | 156,718 | 261,208 | 104,490 | 67 |
| කොටුව | 131,492 | 119,808 | (11,684) | (9) |
| කටුබැද්ද | 42,692 | 35,377 | (7,315) | (17) |
| කටුනායක | 27,092 | 9,256 | (17,836) | (66) |
| නුවර | 40,292 | 22,761 | (17,531) | (44) |
| ගාල්ල | 40,292 | 10,535 | (29,757) | (74) |
| නුවරඑළිය | 7892 | 1,331 | (6,561) | (83) |
| මොරගල්ල | 2,381 | 1,116 | (1,265) | (53) |
| කුරුණෑගල | 1,265 | 1,110 | (155) | (12) |
| බත්තරමුල්ල | 29,492 | 16,889 | (12,603) | (43) |
| නව ශාඛා (05) | 20,528 | 10,174 | (10,354) | (50) |
| | 500,136 | 489,565 | | |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ලක්සල ප්‍රදර්ශනාගාර 15 න් ප්‍රදර්ශනාගාර එකක අපේක්ෂිත විකුණුම් ඉලක්කය ඉක්මවා 67% ඉලක්කයක් සපුරා තිබුණ අතර, ප්‍රදර්ශනාගාර 09 ක අපේක්ෂිත විකුණුම් ඉලක්කයන් ගෙන් සියයට 50 කටත් වඩා ලඟා කර ගැනීමට අපොහොසත් වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ විකුණුම් ආදායම රු.489,564,350 ක් වූ අතර 2011 වර්ෂය තුළ විකුණුම් ආදායම රු.276,368,521 ක් විය. මේ අනුව, ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ විකුණුම් ආදායම රු.213,195,829 කින් හෙවත් සියයට 77 කින් වර්ධනය වී තිබුණි.

## 3.2 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

### 3.2.1 අමාත්‍ය මණ්ඩල අනුමැතියට පටහැනිව රාජ්‍ය ආයතන වෙතින් මණ්ඩලයට ඉදිකිරීම් කොන්ත්‍රාත් ලබා ගැනීම

අලාභ ලබමින් පවත්වා ගෙන ආ මණ්ඩලය ලාභදායීව පවත්වා ගෙන යාම සඳහා 2006 පෙබරවාරි 01 දිනැති අමාත්‍ය මණ්ඩල අංක අමප/06/0211/231/004 මගින් දේශීය කර්මාන්ත කරුවන් ආරක්ෂා කිරීමටත් මණ්ඩලය යටතේ පවත්වා ගෙන යනු ලබන වඩුකාර්මික නිෂ්පාදන ටෙන්ඩර් කැඳවීමකින් හෝ මිල ගණන් කැඳවීමකින් තොරව රාජ්‍ය ආයතනවලට මිලදී ගැනීමට ප්‍රමුඛත්වය ලබා දීමටත් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණි. තවද මිල ගණන් කැඳවීමේ කමිටුවේ සාමාජිකයකු ලෙස භාණ්ඩාගාර නියෝජිතයකුද සහභාගි කර ගතයුතු බවට අමාත්‍ය මණ්ඩලය විසින් නියම කර තිබුණි.

කෙසේ වෙතත් ,මණ්ඩලය පිහිටුවීමේ පනතින් බලය නොපවරන ලද කාර්යයන් පවා ඉටුකර ගත හැකිවන පරිදි හා අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවේ විශේෂයෙන් සඳහන් වූ “කෙසේ වුවද අදාල මිල ගණන් භාණ්ඩාගාර නියෝජිතයකු ඇතුලත් වන නිලධාරී කමිටුවක් මගින් නිශ්චය කල යුතුය යන්න” මුළුමනින්ම මකා දමා අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවට ඇමුණුම 01 ලෙස ඉදිරිපත් කර තිබූ මුල් ඇමුණුමට හාත්පසින්ම වෙනස් වූ කාර්යයන්වූ පරිගණක දත්ත රැහැන් එලීම, විදුලිය හා විද්‍යුත් රැහැන් එලීම, ඉංජිනේරුමය කාර්යයන් වැනි කාර්යයන් ඇතුළත් කර විවිධ වූ කොන්ත්‍රාත් ලබා ගැනීමට හැකි වන පරිදි ඇමුණුම වෙනස් කර එය අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව සමඟ රාජ්‍ය ආයතන වෙත යවා එම ආයතන නොමඟ යවමින් වැඩ හා සේවා මණ්ඩලය වෙත ලබා ගැනීමට කටයුතු කර තිබුණි. මේ අනුව, සමාලෝචිත වර්ෂය අවසානය දක්වා ලබාගෙන තිබූ අමාත්‍ය මණ්ඩල තීරණයට පටහැනි ඉදිකිරීම් කාර්යයන්ගේ වටිනාකම රු. මිලියන 329 ක් විය.

කෙසේ නමුදු, මණ්ඩලය විසින් රාජ්‍ය ආයතන වෙතින් ලබා ගෙන තිබූ කොන්ත්‍රාත් වැඩ අවසන් නොකිරීම්, ප්‍රමාදවීම්, අත්හැරීම් , ප්‍රමිතියෙන් තොරවීම් ආදි හේතුවෙන් මතබේදාත්මක සහ ගැටළු සහගත වී තිබුණි. එවැනි කොන්ත්‍රාත් කිහිපයක් පහත දැක්වේ .

| සේවා ආයතනය | විස්තරය | තත්ත්වය |
|---|---|---|
| ශ්‍රී ජයවර්ධනපුර කොට්ටේ මහ නගර සභාව | වැලිකඩ ළමා උද්‍යානයේ සහ නගර සභා පරිශ්‍රය තුළ සූර්ය බල ශක්තියෙන් ක්‍රියාකරන විදුලි ආලෝක පද්ධති 20 ක් සවිකිරීම | ප්‍රමිතියෙන් තොරව ඉදිකිරීම නිසා සූර්ය බල ශක්ති කට්ටල ක්‍රියා විරහිත වීම. මේ පිළිබඳව කොට්ටේ නගර සභාව මණ්ඩලයට එරෙහිව නඩු පවරා ඇත. |
| දක්ෂිණ සංවර්ධන අධිකාරිය . | ශබ්ද විකාශන පද්ධතිය, වායුසමනය යන්ත්‍ර සවි කිරීම,කේබල් එලීම ආදී විවිධ කාර්යයන් | අදාල ආයතනය විසින් විවිධ අඩුපාඩු සම්බන්ධව වාර්තා කර ඇත. |
| ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව | විකාශන කුළුනක් ඉදිකිරීම | අතර මග නවතා ඇත. |
| ශිල්ප සභාව | ගොඩනැගිලි ඉදිකිරීම් | විවිධ අඩුපාඩු ඇති බව වාර්තා කර ඇත. |
| මහනුවර මහ රෝහල | රෙදිසෝදන යන්ත්‍ර අළුත්වැඩියාව | විවිධ අඩුපාඩු ඇති බව වාර්තා කර ඇත. |

### 3.2.2 **මණ්ඩලය තුළ ඉංජිනේරු ඒකකයක් පිහිටුවීම හා අභ්‍යන්තර හා බාහිර කොන්ත්‍රාත් මණ්ඩලයේ ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන්ට පැවරීම .**

පසුව වෙනස්කරන ලද ඉහත 4.2.1 ඡේදයේ දැක්වෙන අමාත්‍ය මණ්ඩල සංදේශය පදනම් කර මණ්ඩලයේ පාලන අධිකාරිය විසින් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ අංක 2009/44 හා 2010/01 දරන අධ්‍යක්ෂ මණ්ඩල තීරණ ප්‍රකාර 2009 ඔක්තෝබර් මාසයේදී මණ්ඩලය විසින් ඉංජිනේරු ඒකකයක් පිහිටුවා තිබුණි. අංක 2010/01 දරන අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව අනුව මෙම ඒකකයේ කාර්යභාරය " ඕනෑම ආකාරයක ඉංජිනේරු ව්‍යාපෘති කරගෙන යාමට " ලෙස දක්වා තිබුණු අතර, මණ්ඩලයට ආධාරයක් වශයෙන් පිහිටුවන ලද ලාභ මධ්‍යස්ථානයක් ලෙස පවත්වා ගෙන යාමට අනුමත කර තිබුණි. කෙසේ නමුත් මෙම ඒකකයේ කටයුතු 2011 අප්‍රේල් මස සිට අත්හිටුවා තිබුණි.

අත්හිටුවන ලද ඉංජිනේරු ඒකකය 2011 ජුනි 17 දිනැති අංක 2011/29 දරන අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව මගින් එහි කටයුතු ප්‍රතිසංවිධානය කළ යුතු බව තීරණය කර ඉහත කී අමාත්‍ය මණ්ඩල තීරණය පදනම් කර ගනිමින් රාජ්‍ය ආයතනවල ඉදිකිරීම්, අභ්‍යන්තර ඉදිකිරීම්, වඩුවැඩ, ලුහු ඉංජිනේරු කටයුතු, සැපයුම හා සේවා සිදුකිරීම සඳහා නව ඒකකයක් ලෙස පිහිටුවීමට අධ්‍යක්ෂ මණ්ඩල තීරණය කර තිබුණි. ඒ අනුව මණ්ඩලය විසින් ලියාපදිංචි කරන ලද කොන්ත්‍රාත්කරුවන් 04 දෙනෙකුට සියලුම කොන්ත්‍රාත් ලබාදීමටත් , ගොඩනැගිලි නඩත්තු කටයුතු සඳහා රු.මිලියන 2.5 අඩු කොන්ත්‍රාත් එතෙක් මණ්ඩලයේ ඉංජිනේරු ඒකකයක් ලෙස තිබී පසුව පෞද්ගලික ආයතනයක් ලෙස ස්ථාපිත කරන ලද ඉහත එක් ඉදිකිරීම් ආයතනයකට ලබා දීමටත්, බාහිර කොන්ත්‍රාත්වලින් ඔවුන් ලබන ආදායමින් සියයට 2 - සියයට 8 අතර ලාභ ප්‍රතිශතයක් මණ්ඩලයට ආදායමක් ලෙස ලබා ගැනීමටත්, මණ්ඩලය වෙනුවෙන් සේවාදායක ආයතනය සමඟ සියළුම ගිවිසුම් වලට එළඹීමේ බලය මණ්ඩලයේ සභාපති, අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් හෝ අධ්‍යක්ෂ ( මුදල් ) වෙත පවරා දීමටත් කටයුතු කර තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ)** සියළුම කොන්ත්‍රාත් වැඩ ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලීය (ලක්සල) ඉංජිනේරු ඒකකය මඟින් සිදුකරනු ලබන බවට ගිවිසුම්ගත වුවද, **ලක්සල** සතුව එවැනි ඒකකයක් හෝ එවැනි ඒකකයකට අවශ්‍ය සුදුසුකම් ලත් මානව හෝ භෞතික සම්පත් නොතිබුණි.

(ආ) කොන්ත්‍රාත්කරුවන් 04 දෙනා ලියාපදිංචි කිරීමේදී පිළිගත් ක්‍රමවේදයන් අනුගමනය කර නොතිබුණු අතර, මෙම ආයතන කිසිවක් අදාල ක්ෂේත්‍රයන් පිළිබඳව ඉදිකිරීම් සංවර්ධන පරිපාලන ආයතනයේ (ICTAD )හි ලියාපදිංචි වූ ආයතන නොවීම.

(ඇ) සියළුම කොන්ත්‍රාත් ලක්සල ආයතනය නමින් සිදුකරනු ලැබුවද ඒ සම්බන්ධ වූ ගිණුම් ලක්සල මූල්‍ය ප්‍රකාශනවලින් හෙළිදරවු කර නොතිබුණි.

3.2.3 ශිල්පීය පුහුණු අංශය ජාතික ශිල්ප සභාවට පැවරීමට කටයුතු නොකිරීම

පහත සදහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 08/2322/349/015 හා 2008 දෙසැම්බර් 08 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි මණ්ඩලය යටතේ ක්‍රියාත්මක වූ ශිල්පීය පුහුණු අංශය ජාතික ශිල්ප සභාවට පැවරීමට තීරණය කර තිබුණි. 2012 වර්ෂය අවසාන වන විටත් එම කටයුතු අවසන් කර නොතිබුණි. ඉහත අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි ග්‍රාමීය කර්මාන්ත හා ස්වයං රැකියා ප්‍රවර්ධන අමාත්‍යාංශ ලේකම් ගේ අංක 3/4/2/46 හා 2009 අප්‍රේල් 06 දිනැති ලිපියෙන් 2009 මැයි 01 දින සිට මණ්ඩලය යටතේ පැවති ශිල්පීය පුහුණු අංශයට අයත් සේවකයන් 189 ක් ජාතික ශිල්පීය පුහුණු ආයතනයට අනුයුක්ත කර තිබූ අතර එම පුහුණු අංශය යටතේ වූ පුහුණු මධ්‍යස්ථාන 132 ක් ශිල්ප සභාවට පැවරීමට කටයුතු කර තිබුණි. එමෙන්ම එම පුහුණු මධ්‍යස්ථාන පවත්වා ගෙන ගිය ගොඩනැගිලි 70 ක් මණ්ඩලය සතු ගොඩනැගිලි විය. ඒ අනුව එම ගොඩනැගිලිවල පැවති උපකරණ හා යන්ත්‍ර සූත්‍ර, මෙවලම් හා ආයුධ ආදියේ වටිනාකම් අගය කර ජාතික ශිල්ප සභාවට පැවරිය යුතු වුවත්, සේවකයන් හා දේපල භාර දී වසර 04 ක පමණ කාලයක් ගතවී තිබුණද අදාල දේපල නීත්‍යානුකූලව 2013 ඔක්තෝබර් 31 වන විටත් පැවරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2010 සහ 2011 වර්ෂවලට අදාලව මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවලින් මෙම තත්ත්වය අනාවරණය කර නොතිබුණු අතර, 2012 වර්ෂය සදහා ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශනවල ශිල්පීය පුහුණු අංශය යටතේ 2009 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ පහත දැක්වෙන ශේෂයන් එපරිදිම 2012 දෙසැම්බර් 31 දිනට පැවති ශේෂ ලෙස ඇතුළත් කර ඉදිරිපත් කර තිබුණි.

| වත්කම්/වගකීම් වර්ගය | වටිනාකම |
|---|---|
| | රු. |
| ජංගම නොවන වත්කම් | 46,298,422 |
| ජංගම වත්කම් | 31,351,316 |
| ජංගම නොවන වගකීම් | 12,345,384 |
| ජංගම වගකීම් | 17.591,622 |

3.3 නිශ්ක්‍රීය හා ඌණ උපයෝජිත වත්කම්

---------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) හස්ත කර්මාන්ත පුහුණු අංශය ජාතික ශිල්ප සභාවට 2009 වර්ෂයේදී පවරන ලද නමුත්, කටුබැද්ද වඩු පුහුණු අංශය ශිල්ප සභාවට නොපැවරීම නිසා එම පුහුණු පාසලේ තිබූ ලී ඉරීමේ යන්ත්‍ර ලී යතු ගෑමේ යන්ත්‍ර හා ඒ සම්බන්ධ වෙනත් යන්ත්‍ර නිශ්ක්‍රීයව හා ඌණ උපයෝජිතව පැවතුණි.

(ආ) කටුබැද්ද වඩු පුහුණු ව්‍යාපෘතියට අයත් වර්ග අඩි 20,000 පමණ වන තුන් මහල් ගොඩනැගිල්ල සහ ද්විත්ව ඇඳන් 40 කින් යුත් නේවාසිකාගාරය වසර 03 ක සිට නිශ්ක්‍රීයව හා ඌණ උපයෝජිතව පැවතුණි.

(ඇ) මෙයට අමතරව වර්ග අඩි 8,000ක් පමණ වූ බෑග් නිෂ්පාදන මධ්‍යස්ථාන ගොඩනැගිල්ල හා මේස හා ඊට අදාල පුටු 80ක් පමණ නිශ්ක්‍රීයව පැවතුණි.

3.4 හඳුනාගත් පාඩු

----------------

සේවක භාරකාර අරමුදල් පනතට අනුව අරමුදලට ගෙවිය යුතු දායක මුදල් නියමිත දිනට නොගෙවීම නිසා රු.538,405 ක මුදලක් අධිභාර වශයෙන් අය කර තිබුණි.

3.5 දෘශ්‍ය අක්‍රමිකතා

-------------------

මණ්ඩලය විසින්, මණ්ඩලයට අයත් ජංගම බැංකු ගිණුම් 31 පවත්වා තිබූ අතර, එක් බැංකු ගිණුමකින් තවත් බැංකු ගිණුමකට මුදල් මාරු කිරීම් නිරීක්ෂණය වුවත් , එම මුදල් අදාල බැංකුවට බැර නොවී මුදලින් ලබා ගත් අවස්ථා විය. නියැදි පරීක්ෂාවට අනුව එවැනි අවස්ථා දෙකකදී රු. 650,000 ක් බැංකු අතර මුදල් මාරු වී නොතිබුණ අතර, ඒ පිළිබඳ කරුණු විමසීමේදී ප්‍රථමයෙන් ඉදිරිපත් කළ වවුචර්වලට සමාන වෙනස් වූ කරුණු දක්වමින් තවත් වවුචර් දෙකක් ඉදිරිපත් කර තිබුණි. මේ අනුව එකම ගනුදෙනුව සඳහා දෙආකාර වවුචර් දෙකක් විගණනයට ඉදිරිපත් කර තිබීම සැකයට හා මතභේදාත්මක බැවින් මෙවැනි ගනුදෙනු

තවදුරටත් නොතිබේය යන්න බැහැර කළ නොහැකිසේම මණ්ඩලයේ අරමුදල් අවභාවිතයකට නොයෙදුනේය යන්න බැහැර කළ නොහැකි විය.

3.6 සේවක පාරිතෝෂික ප්‍රතිපාදන වෙන්කිරීම් ආයෝජනය නොකිරීම

මණ්ඩලය විසින් 2012 වර්ෂය සඳහා ඉදිරිපත් කරනු ලැබූ මූල්‍ය ප්‍රකාශන අනුව, සේවක පාරිතෝෂික අරමුදල සඳහා රු.28,417,509 ක් වෙන්කර තිබුණද, අනාගත වගකීම්වලට මුහුණ දීම පිණිස එම මුදල් ආයෝජනය කළ යුතු වුවත් එසේ කර නොතිබුණි.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

4.1 **අභ්‍යන්තර විගණනය**

1971 අංක 38 දරන මුදල් පනතේ 13(5)(ඩී) වගන්තිය ප්‍රකාරව 2012 වර්ෂයට අදාලව අභ්‍යන්තර විගණන සැලැස්මක් සකස්කර ඊට විගණකාධිපතිවරයාගේ එකඟතාවය ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. කෙසේ වෙතත්, මණ්ඩලයේ අභ්‍යන්තර පාලන ක්‍රම සාර්ථකව ක්‍රියාත්මක වන බව සොයා බැලීම, ගිණුම්වල සහ වෙනත් වාර්තාවල විශ්වසනීයත්වය ආරක්ෂා වන පරිදි එදිනෙදා ගනුදෙනුවලට අදාල වවුචර් ඇතුළු මූල්‍ය ප්‍රකාශන පරීක්ෂා කළ යුතු වුවත්,මතබේදාත්මකව තිබූ වැඩ සහ ඉදිකිරීම් කොන්ත්‍රාත් හා විවිධ ගෙවීම් සම්බන්ධයෙන් විගණනයක් අභ්‍යන්තර විගණන අංශයෙන් සිදුවී නොතිබුණි.

4.2 සංයුක්ත සැලැස්ම

මණ්ඩලය විසින් 2011 - 2013 වර්ෂ ආවරණය වන පරිදි සංයුක්ත සැලැස්මක් සකස් කර තිබුණද, 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 05 වගන්තිය ප්‍රකාර සංයුක්ත සැලැස්මක් සකස් කර නොතිබුණි. කෙසේවුවත් සංයුක්ත සැලැස්ම කාලානුරූපව සමාලෝචනය කර යාවත්කාලීන කර නොතිබුණි.

4.3 ප්‍රසම්පාදන සැලැස්ම

2003 ජුනි 02 දිනැති පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 05 වගන්තිය ප්‍රකාරව මණ්ඩලය විසින් 2012 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි.

5. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සභාපතිවරයා වෙත දන්වා යවන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ගිණුම්කරණය

(ආ) කොන්ත්‍රාත් පාලනය

(ඇ) මුදල් පාලනය

(ඈ) වත්කම් පාලනය

(ඉ) අයවැය පාලනය